**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.10.16 පැය 1715 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/1899/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

## අන්තර්ජාලය හරහා හෝ ජංගම දූරකථන ඔස්සේ ණය ලබා ගැනීම සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීම - පොලිස් මූලස්ථානය.

අන්තර්ජාලය හරහා මෙන්ම ජංගම දුරකථන ඔස්සේ ආකර්ශනීය ලෙස දැන්වීම් පළ කරමින් හා ඇතැම් අවස්ථාවලදී දුරකථන ඇමතුම් පවා ලබා දෙමින් කිසිඳු ඇපයකින් තොරව ක්ෂණික ණය මුදල් ලබා ගත හැකි බව පෙන්වා දෙමින් ණය ලබා දීම සඳහා ඉදිරිපත් වූ ආයතන විශාල සංඛ්‍යාවක් ශ්‍රී ලංකා පොලිසිය විසින් නිරීක්ෂණය කර ඇත.

එවැනි ආයතන වෙතින් ජංගම දූරකථන හරහා ණය ලබා ගැනීමේදී ගෙවිය යුතු පොලී අනුපාතය හා ණය කාලසීමාව සම්බන්ධයෙන් නිසි අවධානය යොමු නොකර ණය ලබාගැනීමට පුද්ගලයින් කටයුතු කිරීම හේතුවෙන් ඔවුන් විවිධ ගැටළුකාරි තත්ත්වයන්ට මුහුණදී ඇති බව ශ්‍රී ලංකා පොලිසියට වාර්තා වන පැමිණිලි අනුව නිරික්ෂණය වී ඇත.

මෙම ණය මුදල ආපසු ගෙවීමේදී බොහෝ අවස්ථාවල අනපේක්ෂිත ලෙස අධික පොලියක් ගෙවීමට සිදු වන බවත්, එම ආයතන විසින් ණය මුදල් නැවත අය කර ගැනීමට ණය හිමියන් පීඩාවට පත්වන ආකාරයට ඇමතුම් ලබා ගැනීම මෙන්ම අපහාසාත්මක ලෙස සමාජ මාධ්‍ය ජාලා හරහා ප්‍රචාරයන් සිදු කරන බවටද ශ්‍රී ලංකා පොලිසිය වෙත දෛනිකව පැමිණිලි ලැබෙමින් පවතී.

ඒ අනුව මෙවැනි ආකාරයට අන්තර්ජාලය සහ ජංගම දූරකථන හරහා ණය ලබා දෙන ආයතන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසිය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සිදු කරන ලද විමසීමේ දී එවැනි බොහෝ ආයතන ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනය නොකර ඇති බවටත්, ණය දෙන ආයතන සම්බන්ධයෙන් නියාමනය කිරීම සඳහා ගතයුතු ඉදිරි පියවර ගනිමින් සිටින බවත් වැඩිදුරටත් දැනුම්දී ඇත.

එබැවින් සෑම විටම ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනය යටතේ පවතින ආයතන වෙතින් මහජනතාව සිය මූල්‍යමය අවශ්‍යතාවන් සපුරා ගැනීමට කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා පොලිසිය ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**